**තවලම ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**-----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
-------------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 11 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 22 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
-----------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට තවලම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
---------------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**---------------------------**

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ රු.146,867 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දී පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.288,855 ක් වූ පුස්තකාල පොත් ගිණුම් ගතකර නොතිබුණි. | නිවැරදිව ප්‍රාග්ධනගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සළසා නොතිබුණි. | බැරකම් ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.2 නොසැසඳුනු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන / උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.362,158 ක වෙනසක් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය අතර රු.1,093,200 ක වෙනසක් පැවතුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ආදායම් හා වියදම් ගිණුමෙහි වැටුප් හා දීමනා රු.12,066,553 ක් ලෙස සටහන් කර තිබුණ ද, ලෙජර ගිණුමෙහි එම වටිනාකම රු.11,319,746 ක් වශයෙන් දැක්වීමෙන් රු.746,807 ක් වෙනසක් පැවතුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.3 අවිනිශ්චිත ගිණුම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2013 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ලද රු.16,477 ක් වූ අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය නිරවුල් කිරීමට පියවර නොගෙන එම ශේෂය ජංගම වගකීම් වලින් අඩුකර පෙන්වා තිබුණි. | ගැලපීම් කර ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | කාලයක සිට පවතින අසමානතාවයන් බැවින් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ලැබිය යුතු ගිණුම්** | | |
| වර්ෂයකට වඩා වැඩි කාලයකට අදාල රු.5,214,764 ක් වූ ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගත යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |
| **(ආ) ගෙවිය යුතු ගිණුම** | | |
| දිගු කාලයක සිට ඉදිරියට ගෙනඑමින් පවතින රු.2,283,876 ක් වූ ගෙවිය යුතු ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පෙර වර්ෂවල සිට එන ශේෂ නිරවුල් කළ යුතුවේ. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. |

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විස්තරය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.30,748,625 ක් වූ ගිණුම් විෂයයන් 08 ක් සඳහා තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති** | | | |
| (i) රීති 193 | අයවැය සමඟ වැය විෂයයන් සසඳා අතිරික්ත හා ඌනතා වලට හේතු | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | දැක්වෙන ප්‍රකාශනයන් පිළියෙල කර නොතිබුණි. | | |
| (ii) රීති 218 | සභාව සතු සියලුම ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් හෝ පරීක්ෂා කර නොතිබුණි | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**<br>------------------ | | | |
| (i) මුදල් රෙගුලාසි 102 සිට 110 දක්වා | 2019 ජුනි 22 දින අනතුරකට භාජනය වී තිබූ, කැබ් රථයේ හානිවීම් පිළිබඳව කටයුතු කර, එම වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නොදැනුවත්කම නිසා විමර්ශන වාර්තාවල පිටපත් විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකි විය. |
| (ii) මුදල් රෙගුලාසි 1645, 1646 | එක් එක් මාසයේ එළඹෙන 15 දිනට පෙර සභාව විසින් භාවිතා කරන වාහන 08 ක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඉ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව භාරයේ ඇති වාහන 09 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

--------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.85,783 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.1,287,871 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 415,856 | 551,322 | 498,181 | 357,590 | 415,856 | 587,746 | 582,276 | 304,449 |
| කුලී | 4,977,000 | 2,327,710 | 2,301,085 | 141,300 | 4,977,000 | 1,762,890 | 1,725,675 | 114,675 |
| බලපත්‍ර ගාස්තු | 536,425 | 383,571 | 383,571 | 8,800 | 536,425 | 537,679 | 537,679 | 8,800 |
| වෙනත් ආදායම් | 2,562,500 | 2,220,613 | 1,008,860 | 6,595,594 | 3,519,300 | 3,197,523 | 1,961,521 | 5,383,841 |
| | 8,491,781 | 5,483,216 | 4,191,697 | 7,103,284 | 9,448,581 | 6,085,838 | 4,807,151 | 5,811,765 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පලාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.1,405,707 ක් හා මුද්දර ගාස්තු රු.5,123,350 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ප්‍රධාන ලේකම්ගෙන් හිඟ මුදල් ලබා ගැනීමට ලිපි යවා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව මගින් රු.1,459,808 ක මුදලක් වැයකර ඉදිකර තිබූ කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය සඳහා පරිසර අධිකාරියේ අනුමැතිය නොලැබීම හා ඉඩමේ අයිතිය පිළිබඳ ඇති වූ ගැටළුකාරී තත්ත්වය මත ව්‍යාපෘතිය අතරමග නතර කිරීමට සිදුව තිබුණි. තවද වෙනම ඒකකයක් පිහිටුවා දිගුකාලීන වැඩපිළිවෙලකට සභාව අවතීර්ණ වී නොතිබුණි. | කසළ කළමනාකරණය සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුවේ. | කසළ කළමනාකරණය සඳහා දිගුකාලීන සැලැස්මක් ඉදිරියේදී ක්‍රියාත්මක කරන බව දන්වමි. |

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්ඝකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතුවේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරමි. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු හා අතිරික්තතා** | | |
| සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පුරප්පාඩු 09 ක් අතිරික්ත සේවක සංඛ්‍යාව 03 ක් විය. | පුරප්පාඩු විධිමත්ව සම්පූර්ණ කර ගැනීමටත්, අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමටත් කටයුතු කළ යුතුවේ. | තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කරමි. |

(ආ) **සේවක ඇප**

-----------------

| | | |
|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 180 ප්‍රකාර මුදල් හෝ ගබඩා භාරව ක්‍රියා කරන නිලධාරීන්ගෙන් හා ආදායම් එකතු කිරීමේ නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබාගත යුතුවේ. | ඉදිරියේ දී සේවක ඇප තැන්පත් තබා ගැනීමට කටයුතු කරමි. |

## 3.3 වත්කම් කළමනාකරණය

---------------------------------

### 3.3.1 වත්කම් ලේඛනගත නොකිරීම

---------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුර නැගුම ව්‍යාපෘතිය මඟින් රු.58,069,162 ක වියදමක් දරා ඉදි කරන ලද ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල හා සතිපොළ ගොඩනැගිල්ල 2018 වර්ෂයේ දී සභාවට පවරා දී තිබුණු නමුත්, ඉඩම්වල අයිතිය නිරවුල් කර ගත නොහැකි වීම හේතුවෙන් එහි වටිනාකම ගිණුම් ගත කිරීමට නොහැකි වී තිබුණි. | ඉඩම් වල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉඩම් වල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කරමි. |

### 3.3.2 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම

---------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඕපාත සතිපොළ සමාලෝචිත වර්ෂයට රු.901,000 ක බදු මුදලකට ටෙන්ඩර් කර බදු දී තිබුණ ද, අය කළයුතු ගාස්තු පිළිබඳව ගිවිසුමෙහි ඇතුළත් කර නොතිබුණ බැවින් බදුකරු විසින් අධික ලෙස බදු කුලී අයකිරීම හේතුවෙන් කඩ හිමියන්ගේ විරෝධය මත සති 02 ක් තුළ ගිවිසුම අවලංගු කිරීමට සිදු වී තිබුණි. | වලංගු ගිවිසුමෙහි බදු කුලී ඇතුලත් කර එම මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මේ අනුව කටයුතු කරමි. |

### 3.3.3 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 සහ 2015 යන වර්ෂ වලදී සභාවට ලබා දී තිබුණු රු.45,577,614 ක වටිනාකමින් යුත් වාහන 07 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පවරා ගැනීමේ දී දැරීමට සිදුවන වියදම් සඳහා ප්‍රතිපාදන සහා අරමුදලේ නොමැති බව දන්වමි. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබූ අතර, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කළ යුතුවේ. | ඉදිරියේ දී අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා එවීමට කටයුතු කරමි. |